ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2013 මාර්තු 28 වැනි දින |

**2013 මාර්තු මාසයේ දී උද්ධමනය පහළ වැටෙයි.**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.) (2006/2007=100) මගින් මනිනු ලබන උද්ධමනය, ලක්ෂ්‍යමය පදනම මත පූර්ව මාසයේ පැවති සියයට 9.8 හි සිට 2013 මාර්තු මාසයේ දී සියයට 7.5 දක්වා සැලකිය යුතු ලෙස පහළ වැටිණි. පදනම් බලපෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. වාර්ෂික සාමාන්‍ය පදනම මත උද්ධමන අනුපාතිකය 2013 පෙබරවාරි මාසයේ පැවති සියයට 8.6 හි සිට 2013 මාර්තු මාසයේ දී සියයට 8.8 දක්වා ඉහළ නැගිණි.

මෙලෙසම, ලක්ෂ්‍යමය පදනම මත මූලික උද්ධමනය පූර්ව මාසයේ පැවති සියයට 7.4 හි සිට 2013 මාර්තු මාසයේ දී සියයට 6.8 දක්වා පහළ වැටුණු අතර, එය වාර්ෂික සාමාන්‍ය පදනම මත 2013 පෙබරවාරි මාසයේ පැවති සියයට 6.3 හි සිට 2013 මාර්තු මාසයේ දී සියයට 6.4 දක්වා සුළු වශයෙන් ඉහළ නැගිණි.




කො.පා.මි. දර්ශක අගය 2013 පෙබරවාරි මාසයේ පැවති 170.7 හි සිට 2013 මාර්තු මාසයේ දී 170.8 දක්වා නිරපේක්ෂ වශයෙන් වැඩි වෙමින් පූර්ව මාසයට සාපේක්ෂව සියයට 0.1 කින් සුළු වශයෙන් ඉහළ නැගිණි. ආහාර නොවන කාණ්ඩයේ මිල ගණන් සියයට 0.3 කින් වැඩි වීම දර්ශකයේ මෙම මාසික ඉහළ යාම කෙරෙහි ප්‍රධාන වශයෙන් දායක විය. ආහාර නොවන කාණ්ඩයේ, රෙදිපිළි හා පාවහන් (සියයට 0.6 කින්); ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ නඩත්තු (සියයට 0.3 කින්); ප්‍රවාහන (සියයට 0.7 කින්) සහ විවිධ භාණ්ඩ හා සේවා (සියයට 1.1 කින්) යන උප කාණ්ඩයන්හි මිල ගණන් ඉහළ නැගිණි. 2013 පෙබරවාරි මස 23 වැනි දින සිට පෙට්‍රල් සහ ඩීසල් මිල ඉහළ නැංවීම ප්‍රවාහන උප කාණ්ඩයෙහි ඉහළ නැගීම සඳහා මුළුමනින්ම හේතු විය. ආහාර හා මධ්‍යසාර නොවන පාන වර්ග අයත් උප කාණ්ඩයේ සියයට 0.2 ක පහළ යාම මගින් ආහාර නොවන කාණ්ඩයේ බලපෑම යම්තාක් දුරට සමනය විය. සහල්, බොහෝ එළවළු වර්ග, මත්ස්‍ය වර්ග, ටින් මාළු, බිත්තර, ලොකු ළූණු, රතු ළූණු සහ අර්තාපල් ආදියෙහි මිල ගණන් මෙම මාසය තුළ පහළ ගියේය. කෙසේ වුවද, සමහර කරවල වර්ග, පොල්, පොල් තෙල්, පරිප්පු සහ සීනි මිල ගණන්හි ඉහළ යාමක් වාර්තා විය. මේ අතර, නිවාස, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන; සෞඛ්‍ය; සන්නිවේදන; විනෝදාත්මක හා සංස්කෘතික; සහ අධ්‍යාපන යන උප කාණ්ඩයන්හි මිල ගණන් මෙම මාසය තුළ නොවෙනස්ව පැවතිණි.